# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2198/56 - 2020 ඔක්තෝබර් මස 23 වැනි සිකුරාදා - 2020.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### නැගෙනහිර පළාතේ පළාත් සභාව

නිවේදනය

නැගෙනහිර පළාතේ, ආණ්ඩුකාරවර අනුරාධා යහම්පත් වන මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2184/9 හා 2020 ජූලි 13 වැනි දිනැති (අති විශෙෂ) ගැසට් පත්‍රයේ පළ කරන ලද මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සභිකයන්ගේ දීමනා සම්බන්ධ විධිවිධාන පහත පරිදි සංශෝධනය කරනු ලැබේ. එම සංශෝධනය 2020 ජුනි මස 23 වැනි දින සිට බලපැවැත්වේ.

**අනුරාධා යහම්පත්,**
ආණ්ඩුකාරවර,
නැගෙනහිර පළාත.

ආණ්ඩුකාර කාර්යාලය,
නැගෙනහිර පළාත,
2020 සැප්තැම්බර් මස 21 වැනි දින.

**රීති**

**01. මහ නගර සභා**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2184/9 හා 2020 ජූලි 13 වැනි දිනැති (අති විශෙෂ) ගැසට් පත්‍රයේ මහ නගර සභා අනු අංක 1.1 ප්‍රකාශිත රීති අවලංගු කර ඒ වෙනුවට පහත රීති ඇතුළත් කරනු ලැබේ.

1. **මහා නගර සභා නගරාධිපතිවරුන්ට මහ නගර සභාවේ රාජකාරි ගමන් සඳහා ඉන්ධන සීමාවන් නියම කිරීම :**

   1.1 මහා නගර සභාවේ වාහනයක් මහා නගර සභා සීමාව තුළ හෝ මහා නගර සභා සීමාවෙන් පිටත භාවිතා කරන්නේ නම් මසකට ඉන්ධන ඩීසල්/පෙට්‍රල් ලීටර් ඉන්ධන සීමාවන් මහා නගර සභා විසින් සභා සම්මත කරගනු ලබන ඉන්ධන සීමාවන්ට යටත්ව මහා නගර සභාවේ අරමුදලින් දැරිය යුතු ය.

**02. නගර සභා**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2184/9 හා 2020 ජූලි 13 වැනි දිනැති (*අති විශෙෂ*) *ගැසට් පත්‍රයේ* නගර සභා අනු අංක 1:1 ප්‍රකාශිත රීති අවලංගු කර ඒ වෙනුවට පහත රීති ඇතුළත් කරනු ලැබේ.

1. **නගර සභා සභාපතිවරයාට නගර සභාවේ රාජකාරි ගමන් සඳහා ඉන්ධන සීමාවන් නියම කිරීම :**

   1:1 නගර සභාවේ වාහනයක් නගර සභා සීමාව තුළ හෝ සීමාවෙන් පිටත භාවිතා කරන්නේ නම් මසකට ඉන්ධන ඩීසල්/පෙට්‍රල් ලීටර් ඉන්ධන සීමාවන් නගර සභා විසින් සභා සම්මත කරගනු ලබන ඉන්ධන සීමාවන්ට යටත්ව නගර සභාවේ අරමුදලින් දැරිය යුතු ය.

**03. ප්‍රාදේශීය සභා**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2184/9 හා 2020 ජූලි 13 වැනි දිනැති (*අති විශෙෂ*) *ගැසට් පත්‍රයේ* ප්‍රාදේශීය සභා අනු අංක 1:1, 1:2 සහ 1:3 ප්‍රකාශිත රීති අවලංගු කර ඒ වෙනුවට පහත රීති ඇතුළත් කරනු ලැබේ.

1. **ප්‍රාදේශීය සභා සභාපතිවරයාට ප්‍රාදේශීය සභාවේ රාජකාරි ගමන් සඳහා ඉන්ධන සීමාවන් නියම කිරීම :**

   1.1 ප්‍රාදේශීය සභාවේ වාහනයක් ප්‍රාදේශීය සභා සීමාව තුළ හෝ සීමාවෙන් පිටත භාවිතා කරන්නේ නම් මසකට ඉන්ධන ඩීසල්/පෙට්‍රල් ලීටර් ඉන්ධන සීමාවන් ප්‍රාදේශීය සභා විසින් සභා සම්මත කරගනු ලබන ඉන්ධන සීමාවන්ට යටත්ව ප්‍රාදේශීය සභාවේ අරමුදලින් දැරිය යුතු ය.

   ප්‍රාදේශීය සභා රීති හී දුරකථන දීමනා රීති 4හි අනු රීති 4.2 සඳහන් 'උප සභාපතිවරයාට මාසිකව රු. 1,500.00ක් හෝ සත්‍ය කුවිතාන්සි මුදල, මෙයින් අවම මුදල නිවාස දුරකථනය සහ ජංගම දුරකථන දීමනාව වශයෙන් ප්‍රාදේශීය සභා අරමුදලින් ප්‍රතිපූර්ණය කළ හැකි ය.' යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.

**රීති**

**01. මහ නගර සභා**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2184/9 හා 2020 ජූලි 13 වැනි දිනැති (*අති විශෙෂ*) *ගැසට් පත්‍රයේ* මහ නගර සභා අනු අංක 5.1 ප්‍රකාශිත රීති අවලංගු කර ඒ වෙනුවට පහත රීති ඇතුළත් කරනු ලැබේ.

5. **මහා නගර සභා විශේෂ රැස්වීම් සහ ව්‍යවස්ථාපිත කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම වෙනුවෙන් දීමනාව :**

   5.1 නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභිකයින්ට විශේෂ රැස්වීමට සහභාගී වීම වෙනුවෙන් රු. 500.00 දීමනාවක් (උපරිම වශයෙන් රැස්වීම් දෙකක්) සභා අරමුදලින් ගෙවිය හැකිය.

**02. නගර සභා**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2184/9 හා 2020 ජූලි 13 වැනි දිනැති (*අති විශෙෂ*) *ගැසට් පත්‍රයේ* නගර සභා අනු අංක 5:1 ප්‍රකාශිත රීති අවලංගු කර ඒ වෙනුවට පහත රීති ඇතුළත් කරනු ලැබේ.

5. **නගර සභා විශේෂ රැස්වීම් සහ ව්‍යවස්ථාපිත කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම වෙනුවෙන් දීමනාව :**

   5.1 සභාපති, උප සභාපති හා සභිකයින්ට විශේෂ රැස්වීමට සහභාගී වීම වෙනුවෙන් රු. 500.00 දීමනාවක් (උපරිම වශයෙන් රැස්වීම් දෙකක්) සභා අරමුදලින් ගෙවිය හැකිය.

**03. ප්‍රාදේශීය සභා**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2184/9 හා 2020 ජූලි 13 වැනි දිනැති (*අති විශෙෂ*) *ගැසට් පත්‍රයේ* ප්‍රාදේශීය සභා අනු අංක 5 සහ 5:1 ප්‍රකාශිත රීති අවලංගු කර ඒ වෙනුවට පහත රීති ඇතුළත් කරනු ලැබේ.

5. **ප්‍රාදේශීය සභා විශේෂ රැස්වීම් සහ ව්‍යවස්ථාපිත කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම වෙනුවෙන් දීමනාව :**

   5.1 සභාපති, උප සභාපති හා සභිකයින්ට විශේෂ රැස්වීමට සහභාගී වීම වෙනුවෙන් රු. 500.00 දීමනාවක් (උපරිම වශයෙන් රැස්වීම් දෙකක්) සභා අරමුදලින් ගෙවිය හැකිය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.